ජානක එස් කුමාර ජානක එස් කුමාර ජානක එස් කුමාර ජානක එස් කුමාර ජානක එස් කුමාර

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගය

# General certificate of Education (ord. Level ) Examination

පෙරහුරු පරීක්ෂණය peapr NO 03

ඉතිහාසය I

කාලය පැය 01යි

**නම/ විභාග අංකය**

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න, මෙම පත්‍රයට ලකුණු 80 ක් හිමිවේ.**

අංක 01 සිට 40 තෙක් වූ ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න,

01 පහත සඳහන් තොරතුරු අතරින් ක්‍රි.පූ. දෙවන සියවසට පෙර සිලා ලිපිවල ඇතුළත් තොරතුර කුමක්ද?

(1) භික්ෂූන් වහන්සේලාට ලෙන් පිදීම (2) විහාරාවටලට ගම්බිම් පිදීම

(3) පාලනය (4) බදු අයකිරීම හා වෙළඳාම

02. ක්‍රි.ව. 1640 දී ලංකාවට පැමිණ වසර 18 ක් පෘතුගීසි හමුදාවට සේවයකොට සර්පිතාන්වරයෙකු දක්වා උසස් වී වියෝවෘද්ධ කාලයේ ලිස්බන් නුවර වාසය කරමින් ග්‍රන්ථ රචනා කළ පෘතුගීසි ජාතිකයා තවුරුන් ද?

::: (1) ෆිලිප්පස් බැල්දියස් (2) අර්නාඩ් බී ක්වෙරෝස්

(3) රිබෙයිරෝ (4) ඉබන්බතූතා

03. කුරුවිට බටදොඹ ලෙන තුළින් හෙළිවන ප්‍රාග් ඓතිහාසික යුගයේ අභිචාර විධිය පහක සඳහන් කවරක් ද?

(1) දෙට බෙදන ලද සිදුරු විදින ලද හිස් කබලේ එක් සැත්සක ගුරුගල් අලේප කිරීම.

(2) මළසිරුරු දිරායන තුරු වදුලා ඇටසැකිලි ගොඩටගෙන නැවත තැන්පත් කිරීම.

(3) ඇටසැකිලි නමා වකුටුකොට වැළලීම.

(4) සම්පූර්ණ ඇටසැකිළි පුරාම ගුරුගල් ආලේප කිරීම.

04. පහත ස්ථාන අතරින් පූර්ව ඓතිහාසිත යුගයට අයත් ස්ථාන පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) පාහියන්ගල, රංචාමඩම්, ඉබ්බන්කටුව (2) උඩරු,චාමඩම, රංචාමඩම, අලිගල

(3) යටිගල්පොත්ත, ඉබ්බන්කටුව, කටදොඹලෙන (4) බෙරගල, උඩරංචාමඩම, හල්දුම්මුල්ල

05 ශ්‍රී ලංකාවේ යකඩ භාවිතය පිළිබඳ මුල් වරට සාක්ෂි හමුවන්නේ,

(1) ප්‍රාග් ඓතිහාසික යුගයේදී ය. (2) පූර්ව ඓතිහාසික යුගයේදී ය.

(3) මුල් ඓතිහාසික යුගයේදීය. 4) ඓතිහාසික යුගයේදදීය.

06 මුල් ඓතිහාසික යුගයේ පැවති ජනාවාස හා ඒවායේ ප්‍රධාන ආර්ථික කටයුත්ත නිවැරදිවගැලපු විට පිළිතුර වන්නේ,

1. නියමගම් 2.කේවට්ටය ග්‍රාම 3 පට්ඨානගාම 4. කුම්භකාරග්‍රාම

A. වළං සෑදීම B වෙළඳාම C වරාය කටයුතු D ධීවර කර්මාන්තය

අප පුරන් වූ බිමක් නොව ගල්තලාවක් වුවද අස්වද්දන්නේමු

(1) BDCA (2) BACD (3) CADB (4) ACBD

07 පහත සඳහන් කාර්යයක් අතරින් පරුමක සතු කාර්යයක් වන්නේ කුමක්ද?

1) වැටෙන් ජලය බෙදාහැරීම (2) යමේ ආරවුල් විසඳීම

(3) ගමේ අවාහ විවාහ කටයුතුවලට සම්බන්ධ වීම (4) වැව් පද්ධතියක් කාරව කටයුතු කිරීම

08 තමන් ආරෝපණය කරගත් දේවත්ව සංකල්පයෙන් වාසය කළ වර්තමානයේ පවා වියළි කලාපයේ ජනයාගේ පූජනීයත්වයට ලක්වූ රජු කවුරුත් ද

(1) මහසෙන් රජු (2) කූටකණ්ණාභය රජු (3) කාශ්‍යප රජු (4) දුටුගැමුණු රජු

09. වසභ රජතුමාගේ කාලයේ කරන ලද වල්ලිපුරම් රන්පත මගින් හෙළිවන ඔහුගේ සේව වන්නේ,

(1) මහා වැව් ඉදිකිරීම ආරම්භ කිරීමයි. (2) අයබදු අයකිරීම විධිමත් කිරීමයි.

(3) විහාරවලට දීමනා ප්‍රදානය කිරීමයි. (4) ප්‍රාදේශීය පාලනය විධිමත් කිරීමයි.

"වත්හිමියන් වහන්සේ වදාළ එක්තැන් සවියෙන් මෙහි සෙල්ලිපි පාඨය ඇසුරින් 10, 11 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

10. ඉහත පාඨයේ සඳහන් එන්නැත්සවිය" යනු

{i) රාජ සභාවයි (2) අධිකරණයයි. (3) රජතුමාය

11. ඉහත පාඨය ඇතුළත් සෙල්ලිපිය කුමක්ද?

(1) මැදිරිගිරිය සෙල්ලිපිය (2) බුද්ධත්තේහෙල සෙල්ලිපිය සෙල්ලිපිය

(3) පෙරිය පුලියන්කුලම සෙල්ලිපිය (4) කළුදියපොකුණ

12. කාලයක් අතහැර දමා යලිත් වගා කිරීම හඳුන්වන්නේ කවර නමකින් ද?

(2) සොහොන (3) සනත්හ(4) නවදැලිහේන

13. හබන්තොට දිස්ත්‍රික්කයේ තැට්ටුක්කන්ද සෙල්ලිපියේ සඳහන් " ලපනතිස්ස" නම් පුද්ගලයා

(1) නැටුම් ශිල්පියෙකි. 2) ඇත්දත් කැටයම් කරුවෙකි. (3) කම්මල්කරුවෙකි (4) චිත්‍ර ශිල්පියෙකි.

14. පහත වැව් අතරින් මහා වැව් ගණයට වැටෙන පොළොන්නරු යුගයේදී ඉදිකරන ලද වැව

(1) පරාක්‍රම සමුද්‍රය (2) මින්නේරි ( 3) කවුඩුල්ල (4) කන්තලේ

15. ස්වභාවික සුළං උපයෝගී කර ගනිමින් යකඩ නිස්සාරණය කරන ලද්දේ පහත සඳහන් කවර ස්ථානයක් ද?

(1) සීගිරිය දෙනිගහ ඇලකන්ද ප්‍රදේශයේ (2) බලංගොඩ සමනලවැව ප්‍රදේශයේ

(3) අනුරාධපුර අභයගිරිය විහාර භූමියේ (4) උඩරංචාමඩම් නිවාස භූමියේ

16. අතීතයේදී නීති නියාමනය කරන ලද නිලධාරීන් සෙල්ලිපිවල හඳුන්වා ඇත්තේ.

(1) දණ්ඩනායක (2) වෝහාර (3) මේකාප්පර් (4) වහලේ

17. පහත ආහාර අතරින් අතීතයේ දුගී ජනයා අතර සුලබව පැවති ආහාරය කුමක් ද?

(1) පලා මාලුව, කාඩි ඇඹුල්. නිවුඩු කාල් බත් (2) කරවල ඇල්කලේ බිත් ලබු

(3) මොණර මස්, ඇල්හාලේ බත් තල (4) කාඩි ඇඹුල්, කුරක්කන්, වදල්

18. ලංකාවේ පළමු නාගරිකරණ අවධියට අයත් ලක්ෂණය පහත ඒවා අරින් කවරක් ද?

(i) වාණිජ ආර්ථිසා රටාවකට යොමුවීම. (2) ස්වභාවය ආරක්ෂාව සහිත නගර බිහිවීම.

(3) ජ්‍යාමිතික හැඩයකින් යුක්ත රාජධානි බිහිවීම. (4) ප්‍රධාන පාලකයට අමතරව වෙනත් පාලකයින් සිටීම.

19. පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට බල පෑ ආසන්නම හේතුව වන්නේ

(1) කාලිග මාංස ආක්‍රමයයි (2) දුර්වල පාලකයන් බලයට පත්වීමයි.

3) කාලිංපාණ්ඩ්‍ය බල අරගලයයි.. (4) ආර්ථික පරිහානියයි.

20. තෙවන වික්‍රමබාහු රජ සමයේ ගම්පොල රාජධානියට ආර්ය චක්‍රවර්තීන්ගෙන් ඇති වූ බලපෑමෙන් මුදවාගන්නා ලද පුද්ගලයා කවුරුන්ද?

(1) සේනාධිලංකාර සෙනෙවි (2) නිශ්ශංක අලකෙශ්වර

(3) අලගග්කෝනාර (4) සපුමල් කුමරු

21. පහත සඳහන් යුග හා සාහිත්‍ය කෘති යැලසුවිට නිවැරදි පිළිතුර තෝරන්න.

I. ලෝ වැඩ සගරාව — A. දඹදෙනි යුගය
II. දළදා සිරිත, — B කුරුණෑගල යුගය
III. පූජාවලිය, — C – සර්ජාල යුගය
IV. තිසර සංෂද්ශය — D කෝට්ටේ යුගය

(1) BCAD (2) DBAC (3) CDBA (4) BDACA

22 මහනුවර රාජධානියට ස්වභාවික ආරක්ෂාව සැපයූ අංගයක් ලෙස සඳහන් කළ නොහැකි අංගය ද?

(1) බලන දුර්ගය (2) හුන්නස්ගිරිය දුර්ගය 3) මහවැලි ගඟ (4) ගලගෙදර කපොල්ල

23. මහනුවර රාජධානිය හා සම්බන්ධ පහත පුද්ගලයෝ හා ඔවුන්ගේ භෞතිස්ම ලැබූ පසු නම් සමග දක්වා ඇති නිවැරදි පුගලය තෝරන්න

(1 යමසිංහ බණ්ඩාර - දොන් ජුවත් (2) කරනප්පු බණ්ඩාර - දොන් පිලිප්

(3) යසිංහ බණ්ඩාර - ඇයත් පිලිප් (4) වීරසුන්දර බණ්ඩාර දොන් ජුවන්

24. මහනුවර රාජධානියටතේ වගා නොකළ යෝගය කුමක් ද?

(1) තේ (2) ගම්මිරිස් (3) වී (4) පොල්

25. පහත සඳහන් පුනරුද සමය හා සම්බන්ධ යුගල අතුරින් ගැලපීමක් නොමැති යුගලය කුමක්ද?

(1) සොහැන්නස් ගුටන්තර්ග් - පෘථිවිය ගෝලාකාර බව (2) බර්තලමියුඩයස් - කුණාටු තුඩුව

(3) අලගියරි ඩාන්ට සිනා කොම්ඩියා) (4) පර්ඩිනන් මැගලන් පිලිපීනය --

26. යාපන රාජ්‍ය සම්බන්ධයෙන් නොගැළපෙන ප්‍රකාශය කුමක් ද?

(1) වර්ෂ 1561 දී ප්‍රවිරාජ පණ්ඩාරම් නම් කුමරෙක් සංකිලි රජු බලයෙන් පහකොට යාපනයේ බලය අල්ලා ගන්නා ලදී.

(2) පෘතුගීසීන් මෙරටට පැමිණි අවධියේ යාපනයේ පාලකයා වූයේ විජය කුලායෙකියි රජුය. (3) යාපනය කරන ලද්දේ ආර්ය නිනුවර්ති රජ පරම්පරාව විසිනි. (4) 1891 දී පෘතුගීසීන් යාපනය ආක්‍රමණය කොට එදිරිමානසිංයම් නැමැත් අතක් සිංහාසනයට පකරන ලදී.

27. උඩරට රජුන් සමග කටයුතු කිරීමේ දී ලන්දේසීන් අනුගමනය කළ ප්‍රතිපත්තියේ කැපීපෙනෙන ලක්ෂණය වූයේ,

(1) ආගම කිරීමේ අරමුණින් කටයුතු කිරීමයි. (2) උඩරට රජවරු සගිය ගැටුම් ඇතිකර ගැනීමයි.

3) හැකිතාක් ආර්ථික වාසි ලබාගැනීමයි. (4) බ්‍රිතාන්‍යයන් සමඟ උඩරට රජු පවත්වන සබඳතා නැවැත්වීමයි.

28. කාර්මික විප්ලවය සමයේ නිසදවන ලද නිමැවුම් හා ඒවාට සම්බන්ධ පුද්ගලයින් නිවැරදිව ගැළපුවට පිළිතුර වන්නේ

1) සැමුවෙල් කොම්ප්ටන් — A ආරක්ෂක ලාම්පුව
2) හෙන්රි කොට් — B. පියුල් යන්ත්‍රය
3) හම්ප්‍රිඩේව් — C දුම්රිය එන්ජිම
4) ජෝර්ජ් ස්ටීවන්සන් — D රෝලර් යන්ත්‍රය

(1) ABCD (2) CDBA (3) BDAC (4) BDCA

29. කාර්මික විප්ලව සමයේ බ්‍රිතාන්‍යය ඉඩම් කොටුකිරීමේ ව්‍යාපාරය මගින් සිදුවූයේ,

(1) විශාල ඉඩම් වඩා වැටවල් ගැසීමයි. (2) විශාල ඉඩම් ධනවතුන් විසින් අල්ලාගැනීමයි.

(3). විශාල ඉඩම් කොටස්වලට දා වගාවට යොමුකිරීමයි. (4) කුඩා ගවුම එකතුකර විශාලා ගොඩිම් සකස් කිරිමයි

30. පෙරදියට පැමිණි යුරෝපා ජාතීන් හා ඔවුන්ගේ පෙරදිග මධ්‍යස්ථානය නිවැරදිව දක්වා ඇත්තේ,

(1)පෘතුගීසි බතාවිය (2) ප්‍රංශ කල්කටා 03) ඉංග්‍රීසි + මදුරාසිය (4) ලන්දේසි - ගෝව

31. පහත සඳහන් ඒවා අතරින් මියුරන් කොමිසමේ නිර්දෙශයක් නොවන්නෙ කුමක් ද?

(1)ඉංග්‍රීසි ලකාවි සුමය පිහිටුවීම. (2) බිදූ එකතු කිරීමට දේශීය නිලධාරින් පත් කිරිම,

(3) අලුතින් පැනවූ බදූ වර්ග ඉවත් කිරිම, (4) බදූ වෙන්දේසි ක්‍රමය අගගෝසි කිරීම.

32. ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් බවට පත්වූයේ,

(1) 1815 වර්ෂයේදීය (2). 1795 වර්ෂයේදීය. (3) 11Q12 වර්ෂයේදීය. (4). 1818 වර්ෂයේදීය.

33. පහත පුද්ගලයින් අතුරෙන් 1848 දෙවන නිදහස් සටනෙ නායකයෙකු නොවන පුද්ගලයා කවුරුන්ද?

(1) කැප්පෙටිපොල දිසාව 2. වීර පුරන් අප්පු 3) ගොංගාලේගොඩ බණ්ඩා (4) කඩතපොල හිමි

34. පහත සේවාවන් අසරින් අරාමුග නාවලර්තුමාගේ සේවාවක් නොවන්නේ.

(1) යපනයෙ වන්නපොනෙයි ප්‍රදේශයේ මුද්‍රණාලයක් ඇරඹීම. (2) පෙරිය පුරාණම් ග්‍රන්ථය ප්‍රකාශයට පත්කිරීම,

(3) වන්නපොනෙයි ශෛව ප්‍රකාකාය විද්‍යාලය ආරම්භ කිරීම (4) ලංකා ජාතික සංගමය පිහිටුවීමට මුලිකත්වය ගැනීම

35. ප්‍රතිසංස්කරණ පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න,

A දිවයින පළාත් 5ට දීම. B අනිවාර්ය සේවා රාජකාරී ක්‍රමය අහෝසි කිරීම

C ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් පිරිස වැඩි කිරිම. D උඩරට පහතරට ඒකාබද්ධ කිරීම.

E වාර්ශික නියෝජනය අහෝසි කිරීම, F සීමිත ඡන්ද බලය ලැබීම.

(1) ACD (2) ABD (3) BEF (4) ADF

36. ව්‍යවස්ථාදායක සභාව රාජ්‍ය මන්ත්‍රණ සභාව ලෙස හැඳින්වූයේ

(1) මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේය. (2) සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය.

(3) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ ය. (4) කාව් මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංකරණයේ ය

37. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ඇතිකරන ලද විධායක කාරක සභා 7 ට ඇතුළත්නොවන්නේ කුමක් ද?

(1) වරාය කටයුතු (2) ස්වදේශ කටයුතු (3) පළාත් පාලනය

38. නිදහස් ශ්‍රී ලංකාව ප්‍රතම අගමැති වන්නේ,

(1) එස්.ඩබ්. ආර්. ඩී. බණ්ඩාරයක මහතා (2) විලියම් ගොපල්ලව මහතා

3) කොල්වින් ආර්. ද සිල්වා මහතා (4) ඩී. එස්. සේනානායක මහතා

39. බ්‍රිතාන්‍ය පාලන සමයෙ ලංකාවේ සාර්ථක වූ වතු වගාව වන්නේ,

1) කෝපි 2) කොකෝවා 3) සිංකෝන 4) තේ

40. 1978 ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා සතු ව්‍යාවස්ථාදායක බලයක් නොවන්නේ

1) පාර්ලිමේන්තුව කැඳවීම (2), අග්‍ර විනිශ්වකාරවරයා පත් කිරීම

( 3) මංගල පාර්ලිමේන්තුවේ මුලසුන දැරීම (4) පාර්ලිමේන්තුව විසුරුවා හැරීම (2 x 40-80)

ජානක එස් කුමාර ජානක එස් කුමාර ජානක එස් කුමාර ජානක එස් කුමාර ජානක එස් කුමාර ජානක එස් කුමාර

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගය

# General certificate of Education (ord. Level ) Examination

පෙරහුරු පරීක්ෂණය peapr NO 03

ඉතිහාසය I

කාලය පැය තුනයි

නම්/ විභාග අංකය

I කොටසේ පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

II කොටසින් ප්‍රශ්න 04 කට හා III කොටසින් ප්‍රශ්න 01 කට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 06 කි. ඒ සඳහා එක් ප්‍රශ්නයකට 3 + 4 + 5+ 6 = 18 බැගින් ලකුණු හිමිවේ.

I කොටස

01 (අ) පහත (1) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(1) යාන්ඔය, කන්තලේ වැව, මාතොට, දේවනගර, පොළොන්නරුව, කොත්මලේ ජලාශය, කන්දරෝඩෙයි , ගන්නෝරුව, පොතාන, මහා වාලුකා නදී , පාහියන්ගල සීතාවක (ල. 12)

(ii) කැලිකට්, ජිනෝවා, කොන්ස්තන්තිනෝපල් තායිලන්තය, පර්සියන් බොක්ක, බැග්ඩෑඩ් (ල. 06)

(ආ)

(1) පහත A, B, C, D යටතේ දක්වා ඇති ප්‍රශ්න වලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A ඉන්දියාවේ දී අසන්නට ලැබුනු තොරතුරු මත ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තාවක් තබන ලද චීන ජාතික භික්ෂුන් වහන්සේ කවුරුන්ද?

B භික්ෂුන් වහන්සේලාට වැඩ වාසය කිරීම සඳහා පන්, ඉලුක් ආදිය සෙවිලි කොට සකස් කරන ලද නිවාස හඳුන්වනලද නම කුමක් ද?

C කාර්මික විප්ලවය යුරෝපා රටවල් වල ව්‍යාප්ත වූ මුල් අවධියේ සැතපුම් 30,000 ක සමණ දුර මාර්ග ඉදිකළ අධිරාජ්‍ය කුමක් ද?

D 1912 මැතිවරණයෙන් ව්‍යවස්ථාදායක සභාවට තේරීපත් වූ ප්‍රථම උගත් ලාංතිකයා කවුරුත් ද (c. 04)

- A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A රූපය



(ii) 1. A රූපයෙන් දැක්වෙන ස්ථානය කුමක් ද?

2. මෙය පිහිටා ඇති දිස්ත්‍රික්කය කුමක්ද?

3. මෙය මීට වසර කීයකට පමණ පෙර භාවිතා කර තිබේද?


4. මේ ස්ථානය කැණීම කරන ලද්දේ කිනම් වරියක ද?

(iii) 1. B පින්තූරයේ දැක්වෙන්නේ කවුරුන්ද?

2. ඔහු දරන ලද තනතුර කුමක් ද?

3. මොහු පිහිටුවන ලද ප්‍රධාන දේශපාලන පක්ෂය කුමක් ද?

4. මොහුගේ මරණයෙන් පසු එම තනතුරට පත් මොහුගේ පුත්‍රයා නම් කරන්න. (ල. 04)



- ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු ලියන්න.

02

(i) පූර්ව ඓතිහාසික යුගයට අයත් මැටි ඔරු සුසාන හමු වූ ස්ථාන 3 ක් නම් කරන්න.

(ii) පූර්ව ඓතිහාසික යුගය ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන්වන ප්‍රධාන සාධක 4ක් නම් කරන්න.

(iii) ප්‍රාග් ඓතිහාසික යුගයේ අභිචාර විධි සිදු කළ ආකාර 2 ක් උදාහරණ දක්වමින් විස්තර කරන්න.

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල විශාලත්වය අනුව ගොඩනැගුණු ප්‍රධාන ජනාවාස වර්ග තුන උදාහරණ ඇසුරින් විස්තර කරන්න.

03

(1) අනුරාධපුරය නගරයක් ලෙස වර්ධනය වීමට බලපෑ අන්තර්ජාතික වෙළඳාම හා සමබන්ධ පැරණි වරායන් 3 ක් නම් කරන්න.

(ii) පහත A, B, C, D යටතේ දක්වා ඇති පැරණි වෘත්තිකයන් සහ ශිල්පීන් වර්තමානයේ හඳුන්වන නම් ලියන්න,

A මහ වේදානා B වෝහාර C ලපන D දටික

(iii) බුදුදහම මෙරට ව්‍යාප්ත වූ මුල් අවධියේ අනුරාධපුරය හා ඒ අවට විවිධ ආගම් වලට අයත් ජන කණ්ඩායම් සිටි බව උදාහරණ 2 ක් දක්වමින් පැහැදිලි කරන්න.

(iv) පුරාණ කාලයේ ශ්‍රී ලංකාවේ දේශීය වෙළඳාම සාර්ථකව පැවති බව උදාහරණ 3ක් ඇසුරින් විස්තර කරන්න

(04) (1) පනත A, B, C යටතේ දක්වා ඇති නීති පනවන ලද රජවරු නම් කරන්න.

A මාඝාත නීතිය B ජලාශවල ජීවත්වන පක්ෂීන් නොමැරිය යුතු බව C මිනීමැරුමට දඬුවම එල්ලා මැරීම බව

(ii) පුරාණ ශ්‍රී ලංකාවේ මුදල් භාවිකය හා සම්බන්ධ පහත A, B, C, D යටතේ දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A මෙරට කාසි භාවිතය ආරම්භ වන කාලවකවානුව කුමක් ද?

B මෙරට නිෂ්පාදනය කරන ලද මුල්ම කාසි වර්ගය කුමක්ද?

C කාසි අච්චු ගැසීම භාරව සිටි නිලධාරියා සෙල්ලිපිවල හඳුන්වා ඇති නම් කුමක් ද?

D රත්රන් ලෝහය මුදල් ඒකකයක් ලෙස භාවිත කළ බවට හමු වූ රන් ආදෙව්සි කළද සටහන් කරන ලද ලෝහ කැබැල්ල නමු වූ ස්ථානය කුමක් ද?

(iii) පුරාණ ශ්‍රී ලංකාවේ නීතිය හා සම්ප්‍රදාය ආරක්ෂා කිරීම සඳහා පනවා තිබූ ආයතන හා නිලධාරීන් උදාහරණ දක්වමින් කෙටියෙන් විස්තර කරන්න.

(iv) පැරණි ශ්‍රී ලාංකික ජනයාගේ ආහාර රටාව කෘත්‍රිම බවින් තොර ස්වභාවික ගුණයෙන් යුත් ආහාර රටාවක් බව ඔවුන් ලබාගත් ආහාර ඇසුරින් විස්තර කරන්න.

05

(1) මහනුවර රාජධානිය හා සම්බන්ධ පහත A, B, C යටතේ දක්වා ඇති පුද්ගලයින් බෞතිස්ම ලැබූ පසු හඳුන්වන ලද නම් ලියන්න.

A කුසුමාසන දේවිය B යමසිංහ බණ්ඩාර Cකොනප්පු බණ්ඩාර

(ii) පළමුවන විමලධර්ම සූරිය රජු බලයට පත්වීමත් සමග මුහුණපාන්නට සිදු වූ අභියෝග 4 ක් නම් කරන්න.

(iii) A මහනුවර රාජධානිය හඳුන්වන ලද නම් දෙකක් සඳහන් කරන්න.

B මහනුවර රාජධානියේ ස්වභාවික ආරක්ෂාව කරුණු 2 ක් ඇසුරින් කෙටියෙන් ලියා දක්වන්න.

(iv) මහ නුවර රාජධානියේ සමාජ සංවිධාන ව්‍යුහය කරුණු 3ක් ඇසුරින් විස්තරකරන්න.

06 (1) පහත A, B, C යටතේ දක්වා ඇති පෙරදිගට පැමිණි යුරෝපා ජාතීන්ගේ පෙරදිග මධ්‍යස්ථාන නම් කරන්න.

A පෘතුගීසි B ලන්දේසි C ඉංග්‍රීසි

(ii) බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව දෙසට අවධානය යොමු කිරීමට හේතු වූ වෙළඳාම හා සම්බන්ධ සාධකයක් හා පිහිටීම් හා සම්බන්ධ සාධකයක් නම් කරන්න.

(iii) බ්‍රිතාන්‍යයන් වෙරළබඩ ප්‍රදේශ වලින් සෑහීමකට පත්නොවී උඩරට යටත් කරගැනීම කෙරෙහි අවධානය යොමු කිරීමට හේතු වූ කරුණු 2 ක් විස්තර කරන්න.

(iv) A 1818 පළමු නිදහස් සටන හා 1848 දෙවන නිදහස් සටනට ආසන්නම හේතු නම් කරන්න.

B 1848 දෙවන නිදහස් සටනට රජයේ නව බදු ප්‍රතිපත්තිය හේතු වූ ආකාරය උදාහරණ 2 ක් ඇසුරින් විස්තර කරන්න.

07 (1) මිෂනාරි සංවිධාන විසින් තම ආගම ව්‍යාප්ත කිරීම සඳහා යොදාගත් මාධ්‍යයන් තුන නම් කරත්න.

(ii) බෞද්ධයන් විසින් පිහිටුවන ලද මුද්‍රණාල 2 ක් හා බෞද්ධ පුවත්පත් 2 ක් නම් කරන්න

(iii) කෝල්බෲක් ප්‍රතිසංස්කරණය මගින් ලංකාවේ ඇති කරන ලද වෙනස්කම් 2 ක් කෙටියෙන් විස්තර කරන්න,

(iv) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය ලාංකිකයන්ට සැලකිය යුතු දේශපාලන වගකීමක් පැවරූ ආණ්ඩුක්‍රමයක් ලෙස සැලකීමට හේතුවන කරුණු උදාහරණ සහිතව විස්සර කරන්න.

## III කොටස

ප්‍රශ්න 01 කට පමණක් පිළිතුරු ලියන්න.

08

(i)පුනරුද සමයේ විශ්වය පිළිබඳ නව මත ඉදිරිපත් කළ උගතුන් තිදෙනෙකු නම් කරන්න.

(ii) පුනරුද සමයේ සොයාගැනීම් කළ පුද්ගලයන් A, B, C, D අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A බ්‍රහස්පති ග්‍රහයාගේ උප ග්‍රහයන් ඇති බව B මුද්‍රණ යන්ත්‍රය

C ලෙඩ සෑදීමට තුඩුදෙන අහේතු D ගුරුත්වාකර්ෂණ නියමය

(iii) පුනරුදයට පෙර හා පුනරුද සමයේ චිත්‍ර කලාවේ ඇති වූ වෙනස්කම් දෙකක් සන්සන්දනය කරමින් විස්තර කරන්න.

(iv) පුනරුදය ශ්‍රී ලංකාවට බලපෑමේ ප්‍රතිඵල ලෙස ශ්‍රී ලංකාවේ දේශපාලන, ආර්ථික, සමාජීය වශයෙන් ඇති වූ වෙනස් කම් 1 බැගින් විස්තර කරන්න.

09. (i) කාර්මික විප්ලව සමයේ දී බිහිවූ පහත නිෂ්පාදන සිදු කළ පුද්ගලයින් A, B, C අනුපිළිවෙලින් නම් කරන්න.

A මියුල් යන්ත්‍රය B යපස් උණුකිරීමේ විදුලි උඳුන C දුම් බෝට්ටුව

(ii) කාර්මික විප්ලවයට සමගාමීව කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ විශාල වර්ධනයක් ඇතිවීමට බලපෑ ප්‍රධාන සාධක 4 නම් කරන්න.

(iii) කාර්මික විප්ලවය නිසා ලෝක දේශපාලන ක්ෂේත්‍රයෙහි ඇති වූ වෙනස්කම් දෙකක් විස්තර කරන්න.

(iv) කාර්මික විප්ලවයේ ප්‍රතිඵල ලෙස පන්ති සහිත සමාජයක් බිහිවීම තුළින් සමාජ ක්ෂේත්‍රයේ ඇතිවූ ගැටළු 3ත් කෙටියෙන් විස්තර කරන්න,




N